// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2293/70 – 2022 අගෝස්තු 20 වැනි සෙනසුරාදා – 2022.08.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2019/130.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

කේ. ජී. සී. ආර්. බණ්ඩාර මහතා, අංක 117, කපුවැල්ල, නාපාවල, අවිස්සාවේල්ල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත

1A – G 37289 – 14(2022/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බිංගිරිය, අංක 881, නීතිඥ දොන් ලක්මාල් සමන් කුමාර වික්‍රමාරච්චිගේ මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2019/130.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. ජී. සී. ආර්. බණ්ඩාර මහතා, අංක 117, කපුවැල්ල, නාපාවල, අවිස්සාවේල්ල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

1. ''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ලද කේ. ජී. සී. ආර්. බණ්ඩාර මහතාට සේවය තහනම් කිරීමෙන් පසු කරන ලද විනය විභාගයෙන් අනතුරුව ලබාදෙන ලද තීන්දුව මගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ සිදු වී තිබේනම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්නත් හා

2. කේ. ජී. සී. ආර්. බණ්ඩාර මහතාට III A ශ්‍රේණිය හා විධායක තනතුර හිමි ද? හිමිනම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ තිබේනම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද ? කවද සිට ද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 - 0185

---

මගේ අංකය: IR/COM/02/2020/118.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

එච්. එම්. රාජා කුමාරතුංග මයා, අංක 39, ජයසේන්ගම, මොනරාගල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, මොනරාගල ඩිපෝව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, අනගාරික ධර්මපාල මාවතේ, අංක 129/8 බී, ''ජනහිරු'' කාංචන සිල්වා මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2020/118.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

එච්. එම්. රාජා කුමාරතුංග මයා, අංක 39, ජයසේන්ගම, මොනරාගල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, මොනරාගල ඩිපෝව.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් මොනරාගල ඩිපෝවේ ඩිපෝ ආරක්ෂක අංශයේ සේවය කරමින් සිටි එච්. එම්. රාජා කුමාරතුංග මහතාගේ සේවය තහනම් කළ 2016.07.06 දින සිට සේවය නැවත ලබාදුන් 2017.02.12 දින දක්වා කාලයට වැටුප අහිමි කිරීමෙන් හා වැටුප් වර්ධක මාස 06කින් පසුපසට දැමීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද? අසාධාරණයක් සිදුව තිබේනම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද ? යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 - 0186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.